**ශීර්ෂය 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු වුවද, රු.3,309,284 ක් වූ එම ආදායම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීමෙන් තොරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුලත් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි ගිණුම් පිළියෙල කිරිමට ක්‍රියා කල යුතුයි. |
| (ආ) | චක්‍රලේඛයේ 7.10 ප්‍රකාරව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද රු.878,358 ක වියදම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන් විශ්‍රාමයාමේදී අත්තිකාරම් බී ගිණුමට අදාලව ණය ශේෂ නිරවුල් කිරීමේදී පියවන ලද ශේෂයයි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් ආකාරයට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතුය. |
| (ඇ) | අනෙකුත් ශිර්ෂ විසින් අත්තිකාරම් 'බී ' ගිණුමට කරන ලද බැර කිරිම් රු.2,485,357 ක වටිනාකම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේන් අයවිය යුතු ගිණුම් සාරාංශ මඟින් පියවන ලද අත්තිකාරම් බී ගිණුමට අදාල ශේෂය රු2,485,357 ක් වේ. එය නිවැරදිව සටහන් කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් ආකාරයට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.290,600 ක් වටිනා වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් යටතේ පෙන්වා නොතිබුණු අතර එය ආරම්භක ශේෂය තුල අන්තර්ගත කර තිබුණි. | CIGAS මෘදුකාංගය මඟින් දත්ත ඉදිරිපත් වන ආකාරය මත මෙය සිදුවී ඇත. 2021.12.31 දිනට භෞතික වත්කම් හා CIGAS මෘදුකාංගය අනුව පෙන්වන වත්කම් අතර වෙනසක් නොමැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ගිණුම් තැබීමට ක්‍රියාකල යුතුයි. |
| **(ii)** | වර්ෂය තුල අපහරණය කල වත්කම් රු.581,262 ක් ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී අපහරණයන් සිදු වී නොතිබුණි. | CIGAS වැඩසටහට අලුතින් වත්කම් ඇතුලත් කිරීමේදී සමහර අයිතමයන් දෙවරක් සටහන් වී ඇත. ඒ අනුව එම සටහන් නිවැරදි කල හැක්කේ අපහරණ ක්‍රියාවලිය තුලින් පමණක් බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවසන ලදී. ඒ අනුව මෙම රු.581,262 වටිනාකම අපහරණයක් ලෙස පෙන්වයි.එය CIGAS මෘදුකාංගය මඟින් දත්ත ඉදිරිපත් වන ආකාරය අනුව සිදු වී ඇත. | මූල්‍ය ප්‍රකාශන තුලින් සත්‍ය තොරතුරු අනාවරණය කිරීමට වගබලා ගත යුතුයි. |

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ආදායම් නොවන ලැබීම් වටිනාකම රු.3,309,284 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.3,284,284 ක් ලෙස රු.25,000 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අත්හැරීම් දෝෂයක් සිදුවී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි වටිනාකම් ඇතුලත් කිරීමට වගබලා ගත යුතුයි. |
| **(ii)** | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.878,358 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.853,358 ක් ලෙස රු.25,000 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අත්හැරීම් දෝෂයක් සිදුවී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි වටිනාකම් ඇතුලත් කිරීමට වගබලා ගත යුතුයි. |

(ඇ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂ වෙනස රු.215,169 ක් වූ අතර පසුගිය වසර වල සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | වසර කිහිපයක සිට පැවත එන මෙම වෙනස හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බවත් තොරතුරු සොයා ගැනීමේ අපහසුතාවය මත නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති බවත් දන්වා ඇත. | වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයය අංක 301-1-1-1505 සම්මාදම් හා දායක මුදල් සඳහා වූ රු.2,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර වැය විෂයය අංක 301-1-1-1203 යටතේ ප්‍රතිපාදිත මුදලින් සියයට 88 ක් ද 301-1-1-2002 යටතේ ප්‍රතිපාදිත මුදලින් සියයට 71 ක් ද වශයෙන් ඉතිරි වීම් පැවතුණි. | සම්මාදම් සහ දායක මුදල් ගෙවීම සඳහා බැංකුව මඟින් අයදුම් පත්‍ර ඉදිරිපත් කලද විදේශ විනිමය හිඟය හේතුවෙන් අදාල මුදල් නිදහස් කිරීමට නොහැකි වු බැවින් ප්‍රතිපාදන නිසි පරිදි උප යෝජනය කිරීමට නෙහැකි විය. | ප්‍රතිපාදිත මුදල් වර්ෂය තුල උපයෝජනය කිරීමට වගබලා ගත යුතුයි. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ.94 (1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳිය යුතු වුවද වැය විෂය 301-1-1-1409 සඳහා ප්‍රතිපාදනය රු.3,700,000 ක් වු අතර වියදම රු.3,693,047 ක් වූයෙන් රු.6,953 ක ඉතිරියක් පැවතුණි. එම ඉතිරිය ඉක්මවා රු.182,230 ක බැරකම් වලට එළඹ තිබුණි. | අත්‍යාවශ්‍ය වියදමක් වන සනීපාරක්ෂක දියර මිලදී ගැනීම වෙනුවෙන් අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීම නිසා ඉතිරිය ඉක්මවා බැරකම් වලට එළඹීමට සිදු විය. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳීමට වගබලා ගත යුතුය. |
| (ආ) | 2021 ඔක්තෝම්බර් 26 දිනැති 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 4.5 ඡේදය ප්‍රකාරව පරිපූරක ගිණුම් සාරාංශ මඟින් භාණ්ඩාගාරයට වාර්තා නොකල බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස ගෙවිය නොහැකි වුවත් මූල්‍ය ප්‍රකාශනයේ වැය විෂයයන් 03 ක් සම්බන්ධයෙන් දක්වා තිබුණු බැරකම් රු.216,791 ක් ඊට එරෙහිව ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී 2012/02 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට ක්‍රියාකල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය දැක්වෙන වාර්තාවට අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) බැංකු නියාමන අංශය** | | | |
| | සමුපකාර බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමන පළාත් සම්බන්ධිකරණ රැස්වීම් 04 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල රැස්වීම් පවත්වා නොතිබුණු අතර ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණ | කොවිඩ් - 19 වසංගත තත්ත්වය 2021 වර්ෂ ආරම්භයේ පටන් පැවතීම හා රජය විසින් වරින් වර පළාත් සංවරණ සීමා දැඩි කිරීම සිදු කිරීම මත බැංකු නියාමන අංශයේ කාර්යයන් සැලසුම් කර ඇති ආකාරයට ඉටු කිරීමට නොහැකි වූ බව. | අනපේක්ෂිත තත්ත්වයන් ඇති වූ විට ඊට සරිලන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර, අවධානම අවම වූ කාල සීමාවන් තුල හෝ නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතයෙන් අදාල කාර්යයන් ඉටු කිරීමට ක්‍රියා කල යුතුය. |
| **(ආ) සංවර්ධන අංශය** | | | |
| (i) | දැනුම කුසලතා ආකල්ප වලින් පිරිපුන් සේවක බලකායක් බිහි කිරිමේ අරමුණින් පුහුණු සැලැස්මක් සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල එය ඉටු කර නොතිබුණි. | එම වසරේ පැවති කොවිඩ් වසංගත තත්ත්වයක් සමඟ සේවක බලකාය එක් වැඩසටහනක් යටතට රැස්කිරීමට අපහසු වූ බැවින් පළාත් මට්ටමින් පුහුණු වැඩසටහන් සූදානම් කරන ලෙසට උපදෙස් දෙන ලද බව. | ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරිමේදී ඒ පිළිබඳ අවධානය යොමුකල යුතුයි. |
| (ii) | " සියලු ප්‍රාදේශික අඛණ්ඩව ලාභදායිව පවත්වාගෙන යාම" ලෙස ක්‍රියාකාරි සැලැස්මේ කාර්යයක් ඇතුලත් කර තිබුණ ද ඒ සඳහා කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි එකී ක්‍රියාකාරකමෙහි වගකීම පවරා ඇත්තේ අදාල සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට වන අතර මේ සම්බන්ධයෙන් පළාත් මට්ටමින් තොරතුරු ඒකරාශී කිරීම සිදුවන බව. | දෙපාර්තමේන්තුව විසින් ඉටු කිරීමේ වගකීම දරන පාර්ශවය පැහැදිලිව සැලැස්මට ඇතුලත් කලයුතු අතර පසුවිපරම් කටයුතු කාලීනව සිදුකල යුතුය. |

(ඇ) **විගණන අංශය**

| | | | |
|---|---|---|---|
| (i) | ගිණුම් නිසි පරිදි ඉදිරිපත් නොකල සමුපකාර සමිති 12 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති අංශය වෙත යොමු කිරිමට සැලැසුම් කර තිබුණ ද එම කාර්යය ඉටු කර නොතිබුණි. | ගිණුම් ඉදිරිපත් නොකරන සමිති වලට එරෙහිව නිතීමය ක්‍රියාමාර්ග ගන්නා බවට සමිතිය දැනුවත් කරන ලද බව. | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත පරිදි ක්‍රියාත්මක කල යුතුය. |
| (ii) | හඳුනාගත් අක්‍රිය සමිති 03 ක ලියාපදිංචි අවලංගු කිරිමේ දැන්විම් පල කිරිම හා ඈවර කරුවන් පත් කිරීමට සැලැසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල එම කාර්යයන් ඉටු කිරිමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත පරිදි ක්‍රියාත්මක කල යුතුය. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදයට අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | සකස් කිරීමේ කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට ක්‍රියාකල යුතුයි. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

| | | | |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අදාලව නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 හි සඳහන් පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6,1.7 හා 6.3 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් රජයේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලට මාරු වී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.100,084 ක් හා පළාත් සභා ආයතන සඳහා මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.47,353 ක ණය ශේෂ නිරවුල් | ස්ථාන මාරු වූ නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් එක් අයෙකුගේ ශේෂය අය කර ගැනීමට අදාල අමාත්‍යංශයට දන්වා ඇති බවත්,තවත් අයෙකු පිළිබඳව අමාත්‍යංශය වෙනස්වීම මත ණයකරු සොයා ගැනීම අපහසු බවත්,ඉතිරි තැනැත්තාගේ ශේෂය නිරවුල් කිරීමට 1998 වර්ෂයේ මුදල් පොත සොයා ගැනීමේ අපහසුතාවය මත නිරවුල් කිරීම ගැටළු සහගත බවද දන්වා තිබුණි.<br>පලාත් සභාවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු | චක්‍රලේඛ විධිවිධාන පරිදි ණය අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට ක්‍රියාකර නොතිබුණි. එම ණය ශේෂ වර්ෂ 23 සිට 32 දක්වා කාලයක සිට හිඟ ණය ශේෂ විය. | ශේෂ සම්බන්ධයෙන් අදාල තොරතුරු පොල්ගොල්ල සමූපකාර විද්‍යාලය මගින් තහවුරු කර එවන ලෙස දන්වා 2022.05.09 දින ලිපි යොමු කර ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ ආයතන සංග්‍රහයේ 4.2.4 හා 4.2.5 ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය එක් නිලධාරීයෙකුගෙන් අය විය යුතු රු.44,394 ක ශේෂයක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | මේ සම්බන්ධව ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් තහවුරු කිරීම් ලබා ගෙන ඇත. ඒ අනුව තවදුරටත් විස්තර සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහය පරිදි ණය අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| (ඇ) | වර්ෂ 05 ඉක්ම වූ වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.70,401 ක ශේෂයක් ද, සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.48,720 ක ණය ශේෂයක් ද, පැවතී අතර එම ණය ශේෂ සම්බන්ධව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අදාල මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) හා (ඊ) ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කල නිලධාරින්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් පෞද්ගලික ලිපිනයක් වෙත දන්වා ඇති බවත් සේවය හැර ගිය නිලධාරියකු නමින් ලිපිගොනුවක් නොමැති බව ද දන්වා ඇත. | චක්‍රලේඛ පරිදි කටයුතු කිරීමට වගබලා ගත යුතුයි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටු කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | 2021 කාර්ය සාධන වාර්තාව තුළින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට ක්‍රියාකල යුතුයි. |

**5. යහපාලනය**

-----------

**5.1 අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහා වරින් වර ඉල්ලීම් කර ඇතත් මෙතෙක් නිලධාරියෙකු ලබා දී නොමැත. ඉදිරියේදී වැඩබැලීමේ පදනම මත අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගැනීමට කටයුතු කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීමට නියමිතය. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට ක්‍රියාකල යුතුයි. |